# පැවරී ඇති වගකීම් ඉෂ්ඨ කිරීම සඳහා නාගරික මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස්වෙනවා

## මිලින්ද මොරගොඩ කියයි

(ජයන්ත සමරකෝන්)

කොළඹ නගරයේ නාගරික මන්ත්‍රීවරයකු වශයෙන් ක්‍රියාකිරීමට ලැබීම ගරුත්වයක් වූවද, වර්තමානයේ උසුලන වගකීම් සම්භාරය නොපිරිහෙලා ඉටුකිරීමේ අභිලාෂය හේතුවෙන් නගර සභාවේ විපක්ෂ නායක ධුරයෙන් හා මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස්වීමට තීරණය කළ බව මිලින්ද මොරගොඩ මහතා ඊයේ (25) එම විපක්ෂ කණ්ඩායම් රැස්වීමේදී ප්‍රකාශ කෙළේය.

කොළඹ මහ නගර සභා විපක්ෂ නායක කාර්යාලයේදී මෙම කණ්ඩායම් රැස්වීම පැවැත්විණි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ මන්ත්‍රීවරයා මෙසේද කීය.

ත්‍රස්තවාදී යුද පරිසරයක් පැවැති පසුගිය තිස් වසර තුළ කොළඹ නගරය සහ එහි ජීවත්වන පුරවැසියන් මහත් දුෂ්කරතාවයට පත්කරමින් නොසලකා හැර තිබුණු අවස්ථාවක ජනපති ඇරයුමින් සන්ධාන නගරාධිපති අපේක්ෂක ලෙස මැතිවරණයට ඉදිරිපත් වූයෙමි.

කොළඹ නගරය ආසියාවේ හෝ වෙනත් ලෝකයේ ඕනෑම තැනක ඉහළ නවීන නගරයක් බවට පත්කරන විප්ලවීය පරිවර්තනයකට අවශ්‍ය සවිස්තරාත්මක ප්‍රතිපත්ති මාලාවක් ඒ සඳහා ඉදිරිපත් කිරීමට හැකිවිය.

එහෙත් මැතිවරණ ප්‍රතිඵලයෙන් පැහැදිලි ජනවරමක් නොලැබුණි.

එසේ වුවද, පසුගිය කොළඹ මහ නගර සභා මැතිවරණ ප්‍රතිඵලය ඉදිරි මැතිවරණවලදී එජනිසයට කොළඹ නගර වැසියන්ගේ පැහැදිලි මනාපය ලැබෙනු ඇති වැදගත් පෙරළියක් බවට එමගින් ප්‍රථමවරට ඉඟි පළ විය.

ශක්තිමත් කණ්ඩායමක් ගොඩනැංවීමට පසුගිය මාස හය තුළ මම මහන්සිවී ක්‍රියා කෙළෙමි.

එහි ප්‍රතිඵලයක් ලෙස මහ නගර සභාව තුළ අප අද ශක්තිමත් තත්ත්වයක සිටින්නෙමු.

මෑතකදී අප කණ්ඩායම මහ නගර සභාවේ ඉතාමත්ම වැදගත් කමිටුව වන මුදල් කමිටුවේ බලය බහුතර ඡන්ද ගණනකින් දිනාගැනීම එහි ප්‍රතිඵලයකි.

මාගේ අස්වීමෙන් පසු අභිනවයෙන් පත්වන නායකත්වයට අවශ්‍ය කරන උපදෙස් හෝ මඟ පෙන්වීම නොපිරිහෙලා සැපයීමට මම සූදානම්ව සිටිමි.

අප නාගරික ජනතාවගේ සේවය උදෙසා පවත්වාගෙන ගිය වැඩසටහන් එලෙසම පවතින බවද සඳහන් කරනු කැමැත්තෙමි.

ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක වශයෙන් පැවරී ඇති මාගේ කාර්යභාරයේදී ඔබට ඇති සහාය හා උපකාරය එලෙසම පවතිනු ඇත.

විපක්ෂ නායක ධුරය හොබවන ලද කාලයේදී සහාය දෙමින් දිරිමත් කිරීම පිළිබඳව ජනාධිපතිතුමාට හා ආරක්ෂක ලේකම්තුමාටත්, නගරාධිපති, නාගරික කොමසාරිස්තුමියටත් පක්ෂ විපක්ෂ මන්ත්‍රී කණ්ඩායමටත් මාගේ ස්තුතිය පළ කරමි.

වැදගත් ජාත්‍යන්තර සංවිධානයක තනතුරක් බාරගැනීමට යන බවට ඉඟි පළ කරන ලද මාධ්‍ය වාර්තා සත්‍යයෙන් තොර පදනමක් රහිත ඒවා බව ද දන්වමි.